# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
## 2016 දෙසැම්බර් මස 29 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ

II. සභාපතිවරයාගේ නිවේදන

III. ලිපි ලේඛන පිළිගැන්වීම

IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම

V. පෙත්සම්

VI. ප්‍රශ්න

VII. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VIII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

IX. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :

යෝජනාව :

*"2016.12.26 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයනට අනුව අද දින [2016.12.29 දින] න්‍යාය පත්‍රයේ සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 15(1), 15(4), 57(1), 57(3), 57(4), 57(5), 63අ(2), 63අ(3), 88(2) හා 88(3) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."*

X. සභාවේ රැස්වීම

ගරු සභා කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :

යෝජනාව :

*"අද දින විසිර යෑමෙන් අනතුරුව, 2017.01.17 වන දින පෙ.ව. 9.30 ට මෙම පළාත් සභාව රැස්විය යුතු අතර 2017.01.03 දිනය සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයක් යැයි සළකා ක්‍රියා කළ යුතුය."*

## XI. පොදු කටයුතු

ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) :

**යෝජනාව :**

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය*
*සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත*

*"දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ළ (3) අනු ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස, අතිගරු ජනාධිපතිතුමන් විසින් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත එවනු ලදුව, ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම පළාත් සභාව වෙත යොමු කරන ලද, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය - සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත," 2016.12.29 දින (අද දින) මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට පිළිගන්වන ලදින්, හා සීමිත කාල පරාසයක් තුළ එම කටයුතු නිම කර ගැනීමට අවශ්‍යතාවය පැන නැගී ඇති හෙයින්, මීට පෙර මෙම සභාවේදී එළඹුණු එකඟතාවයන් පිළිබඳව ද සැලකිලිමත්ව ක්‍රියා කරමින්, එම පනත් කෙටුම්පත සම්බන්ධව අද දින (2016.12.29 දින) මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළඹෙන තීරණයන්ට අනුව සකසන ලද, මෙම පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයන් අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීම සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට ක්‍රියා කළ යුතු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි."*

## XII. සභාව කල් තැබීම

**කේ.එච්.ඩී.කේ. සමරකෝන්,**
**ලේකම්,**
**බස්නාහිර පළාතේ පළාත් සභාව**

**2016.12.26 දින**
**සභා ලේකම් කාර්යාලය,**
**බස්නාහිර පළාතේ පළාත් සභාව,**
**5වන මහළ, B පර්යන්තය,**
**සෙත්සිරිපාය,**
**බත්තරමුල්ල.**